" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන /தொலைபேசி/ Telephone - 011 - 2092599
ෆැක්ස් /பெக்ஸ்/ Fax - 011 - 2092601
ඊ-මේල් /மின்னஞ்சல்/ E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 SLSI
SLAB ACCREDITED ISO/IEC 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-AP/03/FI/06(A)
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2019.06. 12

## මූල්‍ය චක්‍රලේඛ 06/2019

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.).

**පළාත් අමාත්‍ය මණ්ඩලය නොමැති අවස්ථාවලදී අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුවක කටයුතු සහ එහි අභියාචනා.**

"නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය බස්නාහිර පළාත් සභාව සඳහා උචිත පරිදි අදාල කර ගැනීම" යන මැයෙන් වන 2008.04.02 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 01/2008 හි ඇමුණුම් අංක 09 සහ කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා අධිකාරී සීමාවන් යන මැයෙන් යුතු 2017.12.14 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 10/2017 හි ඇමුණුම් අංක 01, ඇමුණුම් අංක 04 සහ ඇමුණුම් අංක 06 කෙරෙහි අවධානය යොමු කරමි.

02. එමඟින් අමාත්‍ය මණ්ඩලය පත් කල ප්‍රසම්පාදන කමිටු සීමා, ප්‍රසම්පාදන පටිපාටියෙන් බැහැරවීම සම්බන්ධ අධිකාරි සීමා, ප්‍රසම්පාදන කමිටු නිර්දේශ හා නිර්ණයන් පිළිබඳ අනුමැතිය ලබා දීම සහ අමාත්‍ය මණ්ඩලය පත් කල ප්‍රසම්පාදන කමිටුවක අභියාචනා සම්බන්ධ විධිවිධානයන් දැක්වේ.

03. පළාත් අමාත්‍ය මණ්ඩලයක් නොමැති අවස්ථාවල අමාත්‍ය මණ්ඩලයක් පත් කරන ප්‍රසම්පාදන කමිටුවල කටයුතු සම්බන්ධයෙන් මූල්‍ය රීති 424 ප්‍රකාරව ගරු ආණ්ඩුකාරවරයාට බලතල හිමිවන හෙයින් අමාත්‍ය මණ්ඩලයක් නොමැති අවස්ථාවක අමාත්‍ය මණ්ඩලය පත් කරන ප්‍රසම්පාදන කමිටු පිළිබඳව පහත පරිදි කටයුතු කිරීමට ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

04. දැනට අමාත්‍ය මණ්ඩලයක් පත් කල ප්‍රසම්පාදන කමිටු කටයුතු කරනුයේ රුපියල් මිලියන 250 ට වැඩි කොන්ත්‍රාත්තු සඳහාය. පළාත් අමාත්‍ය මණ්ඩලයක් නොමැති අවස්ථාවක පහත දැක්වෙන ක්‍රියාපටිපාටිය එම සීමාව ඉක්මවන කොන්ත්‍රාත්තු සඳහා අදාල වේ.


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதிப் பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල් / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளக கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

**I. රුපියල් මිලියන 250 ට වැඩි ප්‍රසම්පාදන කමිටු පත් කිරීම.**

අමාත්‍ය මණ්ඩලය නොපවතින අවස්ථාවක මිලියන 250 ට වැඩි ප්‍රසම්පාදන කමිටුව පත් කිරීමේ බලය ප්‍රධාන ලේකම්වරයා සතු වන අතර, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් නියමිත ආකෘතිපත්‍රයෙන් ප්‍රධාන ලේකම්වරයා වෙත එම ඉල්ලීම ඉදිරිපත් කර ඔහුගේ අනුමැතිය ලබා ගත යුතු වේ.

ප්‍රසම්පාදන කමිටුවේ සංයුතිය පහත පරිදි විය යුතුවේ.

i. මෙම ප්‍රසම්පාදන කමිටුවේ සාමාජික සංඛ්‍යාව තිදෙනෙකුට නොවැඩි විය යුතුය.

ii. ප්‍රසම්පාදන කමිටුවට සභාපතිවරයකු සිටිය යුතු අතර, ඔහු විෂය අදාල ආයතනයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා නොවන වෙනත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියකු විය යුතුය.

iii. මූල්‍ය කටයුතු පිළිබඳ දැනුම ඇති අයකු කමිටුවේ සාමාජිකයකු විය යුතුය.

**II. ඉහත (1) හි සඳහන් ප්‍රසම්පාදන කමිටුවට අදාල තාක්ෂණික ඇගයීම් කමිටුව.**

තාක්ෂණික ඇගයීම් කමිටුවද ප්‍රසම්පාදන කමිටුව පත්කිරීමට සමගාමීව ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය මත පත් කරවා ගත යුතුය.

තාක්ෂණික ඇගයීම් කමිටුවේ සංයුතිය පහත පරිදි විය යුතුවේ.

i. තාක්ෂණික ඇගයීම් කමිටුවේ අවම සාමාජිකයින් සංඛ්‍යාව 05 ක් විය යුතුය.

ii. තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා සභාපතිවරයකු සිටිය යුතුය.

iii. තාක්ෂණික ඇගයීම් කමිටුවේ අවම වශයෙන් එක් සාමාජිකයකු ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය පිළිබඳ දැනුම ඇති අයෙකු විය යුතුය.

iv. අවම වශයෙන් එක් සාමාජිකයකු " **විෂය විශේෂඥයකු**"* විය යුතුය.

v. අවම වශයෙන් එක් සාමාජිකයකු ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් පරිබාහිර අයකු විය යුතුය.

* **විෂය විශේෂඥයින්** යනුවෙන් අදහස් කෙරෙනුයේ, ප්‍රසම්පාදනයට අදාලව, තාක්ෂණික/මූල්‍ය කරුණු සහ වෙනත් අදාල කරුණු පදනම් කරගෙන ලංසුවල ප්‍රතිචාරය පිළිබඳව තීරණයකට එළඹිය හැකි දැනුමෙන් පරිණත පුද්ගලයෙකි.

**III. ප්‍රසම්පාදන කමිටු විසින් තීරණ ගැනීම.**

අමාත්‍ය මණ්ඩලයක් පවතින අවස්ථාවකදී අමාත්‍ය මණ්ඩලය පත් කරන ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සිදුකරන ලබන සියලුම කාර්යයන් මෙම ප්‍රසම්පාදන කමිටුවෙන් හා තාක්ෂණ ඇගයීම් කමිටුවෙන් ඉටු කල යුතු අතර, අවසාන තීරණ ගැනීමේ බලයද ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

**IV. අභියාචනා බලය**

මෙම ප්‍රසම්පාදන කමිටුවේ තීරණ පිළිබඳ අභියාචනා බලය ගරු ආණ්ඩුකාරවරයා සතු වේ.

05. ඉහත සඳහන් විධිවිධාන හැර අනෙකුත් සියලු කරුණු සම්බන්ධයෙන් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය, 2006 ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය සහ ඒ අනුව නිකුත් කරන ලද ප්‍රසම්පාදනය සම්බන්ධ සියලු මූල්‍ය චක්‍රලේඛ ප්‍රසම්පාදන අස්ථිත්වයේ, ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සියලු කාර්යයන්ට සහ අභියාචනා කටයුතු සම්බන්ධව අදාල වේ.

06. මෙහි සඳහන් සියලු විධිවිධාන අදාල වනුයේ පළාත් අමාත්‍ය මණ්ඩලයක් නොමැති අවස්ථාවක පමණක් වන අතර, පළාත් අමාත්‍ය මණ්ඩලය පවතින අවස්ථාවක මෙම චක්‍රලේඛයේ සඳහන් සියලු විධිවිධානයන් යටපත් වන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.